# ලංකා ඉතිහාසය

## 6.1.1 දඹදෙණිය රාජධානිය
## ( අභ්‍යාස )



බහුවරණ ප්‍රශ්න

1.) කාලිංග මාඝගේ ආක්‍රමණයෙන් පසු දකුණු දිග දුර්ග ස්ථානයක් වූ ගොවින්ද මලයෙහි සිට එම ප්‍රදේශය ආරක්ෂා කර ගත්තේ,

1 ) සුභ සෙනෙවි  2 ) සංඛ සෙනෙවි
3 ) බුවනෙකබාහු ආදිපාද  4 ) වන්නි විජයබාහු
5 ) සේනාධිලංකාර සෙනෙවි

2. ) පහත දැක්වෙන තොරතුරු ඇසුරින් පහත ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A. ) කාලිංග මාඝ පරාජය  B.) ආර්ය චක්‍රවර්ති යටත් කිරීම.
C. ) චන්ද්‍රභානු පරාජය  D.) අදිවීරරාම පටුන ආක්‍රමණය.
E. ) දඹදෙණියේ විජයසුන්දරාරාමය කරවීම.  F.) දඹදෙණි කතිකාවත සම්පාදනය.

* ඉහත කරුණු අතරින් දෙවන පරාක්‍රමබාහු රජුගේ කාර්යයන් මොනවා ද?

1 ) ACE  2 ) ADF  3 ) BCD  4 ) BDF  5 ) ACF

3. ) 1411 දී ලංකාවට පැමිණි වෙංහෝ නැමති චීන සෙන්පතියා විසින් චීනයට රැගෙන ගිය එකල ලංකාවේ සිටි ප්‍රාදේශීය පාලකයා වන්නේ,

1 ) වීර අලකේශ්වර ය.  2 ) වීරබාහු ඇපා ය.  3 ) වීර පරාක්‍රමබාහු ය.
4 ) වීර සුන්දර බණ්ඩාර ය.  5 ) වීරසිංහ පතිරාජ ය.

4. ) දඹදෙණි යුගයේ සිටි ශ්‍රේෂ්ඨ පාලකයෙකු වූ II පරාක්‍රමබාහු රජු විසින් රචිත සාහිත්‍ය කෘතියක් වන්නේ,

1 ) පූජාවලිය යි.  2 ) කව් සිළුමිණ යි.  3 ) සමන්තකූට වර්ණනාව යි.
4) භේසජ්ජ මඤ්ජුසාව යි.  5 )සද්ධර්මරත්නාවලිය යි.

5. ) III විජයබාහු රජු දළදා වහන්සේ තැන්පත් කිරීම සඳහා දළදා මාලිගයක් ඉදි කරන ලද ස්ථානය වන්නේ,

1 )බෙලිගල පර්වතය.  2 ) දඹදෙණිය විජයසුන්දරාරාමය.
3 ) වත්තල විජයබාහු විහාරය.  4 ) දෙල්ගමුව විහාරය.
5 ) පඬුවස් නුවර.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය. ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

රචනා ප්‍රශ්න

01. ) III විජයබාහු රජතුමාගේ දේශපාලන හා ආගමික වැදගත්කම කරුණු දෙකක් යටතේ විස්තර කරන්න.

02. ) III පරාක්‍රමබාහු රජුගේ,

A - දේශපාලනික වැදගත්කම
B - එතුමා විසින් කරන ලද ආගමික කටයුතු
C - එතුමාගේ පාලන කාලයේ සිදුවූ අධ්‍යාපනික හා ශාස්ත්‍රීය වර්ධනය
පිළිබඳව කරුණු දෙකක් යටතේ විස්තර කරන්න.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය. ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk